*සැ. යු.*- 2018.02.16 දින පළ වූ අංක 2,059 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,060 - 2018 පෙබරවාරි මස 23 වැනි සිකුරාදා - 2018.02.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 322 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මාර්තු මස 16 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සභාව

### වයඹ පළාතේ පළාත් සභාවේ 2018 අංක ...................... දරන වයඹ පළාත් පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2018 අංක.............දරන වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳ ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත් එය එදිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ලක්ෂ්මන් වේඩරුව,<br>
අමාත්‍ය,<br>
වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය.

වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය,<br>
3 වැනි මහළ,<br>
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>
කුරුණෑගල.

.......................... අංක............. දරන

### වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා ප්‍රඥප්තිය (කෙටුම්පත)

දීර්ඝ නාමය

වයඹ පළාත තුළ අනාථ, අත්හල , අසරණ හා අපයෝජනයට පත්වූ ළමුනට භාරය, රැකවරණය සලසමින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ළමුන්ට අදාළ සියලු සුභසාධන කටයුතු පවත්වාගෙන යාම සහ අධිකරණ මගින් යොමුවන නීතිය හා ගැටුණු ළමුන් හා වැඩිහිටි වරදකරුවන් පුනරුත්ථාපනයට අදාළ සේවාවන් පවත්වාගෙන යාම සහ ඊට ආනුශාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමත් සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය, අංක............ හා ........................දින දරන වයඹ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රඥප්තියේ අරමුණු

02. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වන්නේ ය.

(1) වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(2) වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා අරමුදල ස්ථාපනය කොට පවත්වාගෙන යාම.

(3) වයඹ පළාත තුළ පදිංචි සහ වයඹ පළාත තුළ දී අනාථ, අත්හල හෝ අසරණ භාවයට පත්වන සහ අපයෝජනයට ලක්වන හා ලක්වීමට ඉඩ ඇති ළමුන්ගේ භාරය, රැකවරණය සැලසීම සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

(4) නීතිය හා ගැටුණු හා පාලන අතික්‍රාන්ත ළමුන් සහ අධිකරණ මගින් යොමු කරනු ලබන වරදකරුවන් පුනරුත්ථාපනයට හා පරිවාස භාරයේ තැබීමට අදාළ කටයුතු කිරීම.

(5) අනාථ, අත්හල, අසරණ, හා අපයෝජනයට ලක්වූ හා නීතිය හා ගැටුණු ළමුන්ගේ රැකවරණයට සහ පුනරුත්ථාපනයට අදාළ නේවාසික පහසුකම් සැළසීම සහ දිවා කාලයේ දී රැකවරණය සැළසීම සඳහා ස්වේච්ඡා පදනමින් හෝ ව්‍යාපාරික අරමුණකින් හෝ පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම නියාමනය කිරීම හා පහසුකම් සැලසීම.

(6) වයඹ පළාත තුළ පදිංචි සෑම ළමයෙකුගේම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, ආරක්ෂා කිරීම හා අපයෝජනයට ලක් වීම වැලැක්වීම සඳහා ගත හැකි සහ ගත යුතු සියලුම ක්‍රියාමාර්ග ගැනීම.

(7) වයඹ පළාත තුළ ළමුන් වෙනුවෙන් සේවා සැපයෙන සියලු ආයතනයන්හි පවත්වාගෙන යා යුතු ප්‍රමිතීන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.

(8) ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෑම ග්‍රාම නිලධාරී වසමකටම ළමා සමාජයක් ආරම්භ කර ලියාපදිංචි කර පවත්වාගෙන යාම.

## I කොටස

### වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම, එහි සංයුතිය, බලතල හා කාර්යයන්

පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

03. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්පසු පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් පිහිටවිය යුතු වන්නේය.

වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් කාර්ය මණ්ඩලය

04. (1) මෙහි මින්මතු පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පංතියේ නිලධරයෙකු මෙම ප්‍රඥප්තියේ 03 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය.

(2) පළාත් කොමසාරිස්වරයාට සහාය වනු පිණිස දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගෙන් සහකාර කොමසාරිස්වරයෙකු ද, කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක දෙක සඳහා ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරීන් දෙදෙනෙකු ද, මෙම ප්‍රඥප්තියේ කර්තව්‍යයන් ඉටු කර ගැනීම සඳහා නෛතික ප්‍රතිපාදන ප්‍රකාරව පිහිටුවන ලබන සෑම උප කාර්යාලයක් සඳහාම ස්ථාන භාර පරිවාස නිලධරයෙකු බැගින්ද, එම පරිවාස කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් ආවරණය වන පරිදි පරිවාස නිලධරයන් හා සංවර්ධන නිලධාරීන් හා තත්කාලීනව සේවා අවශ්‍යතාවය මත බඳවා ගනු ලබන නිලධාරීන්ගෙන්ද සමන්විත කාර්ය මණ්ඩලයකින් යුක්ත විය යුතු වන්නේ ය.

(3) මෙම ප්‍රඥප්තියෙන්, කොමසාරිස්වරයා වෙත පැවරෙන බලතල හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්, ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධරයන්, ස්ථාන භාර පරිවාස නිලධරයන්, පරිවාස නිලධාරීවරුන් හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරීන් වෙත පළාත් කොමසාරිස්වරයා විසින් ස්වකීය බලතල පැවරිය හැක්කේය.

(4) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත් කරනු ලබන සියලුම නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකුලව රජයේ නිලධරයන් වශයෙන් සැළකිය යුත්තේය.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන්

05. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන් පහත සඳහන් පරිදි වන්නේ ය.

(1) අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයන්ට ලක් වූ ළමුන්ට රැකවරණය සළසන ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම හා එවැනි ආයතන සඳහා පහසුකම් සැලසීම.

(2) වයඹ පළාත තුළ අනාථ, අත්හල හා අසරණ, අපයෝජනයට ලක්වූ ළමුන්ගේ භාරය ආරක්ෂාව තහවුරු කරමින් නේවාසික රැකවරණය සැළසීම,අධ්‍යාපනය, පෝෂණය හා වෘත්තීය පුහුණුව ලබා දීම.

(3) i. මෙම වගන්තියේ (1) වන උප වගන්තිය මගින් විස්තර කරන ළමුන් සඳහා වයසට අනුකූල හා වර්ධනයට අවශ්‍ය සමබල ආහාර පාන සැපයීම පිළිබඳව අධීක්ෂණය කිරීම.

ii. මෙම වගන්තියේ (2) වන උප වගන්තිය මගින් විස්තර කරන ලද ළමුන් සඳහා වයසට සරිලන විධිමත් හා නොවිධිමත් අධ්‍යාපන පහසුකම් සහ වෘත්තීය පුහුණු සැපයීම පිළිබඳව අධීක්ෂණය කිරීම.

iii. ඉහත (1) වන උප වගන්තියෙන් දැක්වෙන ළමුන්ගේ මානසික සෞඛ්‍යය සහ සංවර්ධනයට අදාළ පහසුකම් සැළසීම පිළිබඳ අධීක්ෂණය කිරීම.

iv. ඉහත (1) වන උප වගන්තියේ දැක්වෙන ළමුන් සඳහා සෞඛ්‍ය පහසුකම් සැලසීම පිළිබඳ අධීක්ෂණය කිරීම.

v. ඉහත (1) වන උප වගන්තියේ ළමුන්ගේ දක්ෂතා හා නිර්මාණශීලි හැකියාවන්, සෞන්දර්යාත්මක සහ ක්‍රීඩා කුසලතාවන් සංවර්ධනයට අදාළ පහසුකම් පිළිබඳව අධීක්ෂණය කිරීම.

vi. ඉහත 3 (1) වන උප වගන්තියේ ළමුන් සඳහා අධ්‍යාත්මික, සදාචාරාත්මක හා සංස්කෘතික සංවර්ධනයට අදාළ පහසුකම් සැපයීම පිළිබඳව අධීක්ෂණය කිරීම.

vii. ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා කාර්යය මණ්ඩල බඳවා ගැනීමේදී කොමසාරිස්වරයා විසින් පත්කරන ලද සාමාජිකයෙකු ද ඇතුළත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට විධිවිධාන සැලැස්වීම.

(4) දෙමාපියන්, නීත්‍යානුකූල භාරකරුවන් හා නීත්‍යානුකූල භාරකරුවන් නොවන එහෙත් ඥාතීන් හෝ ඥාතීන් නොවන හෝ පුද්ගලයින් විසින් භාරකාරත්වය ගෙන කටයුතු කිරීමට අපේක්ෂිත සහ කුලවද්දා ගැනිමට අපේක්ෂිත තැනැත්තන් වෙත ළමුන් භාර දෙමින් සමාජ ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(5) කැපකරු මව්-පිය ක්‍රමය යටතේ දරුවන් සඳහා සුදුසු කැපකාර දෙමාපියන් ලියාපදිංචි කිරීම, වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

(6) මෙම ප්‍රඥප්තියේ හෝ වෙනත් ඕනෑම නීතියක සැලසී ඇති ප්‍රතිපාදන අනුව නීතිය හා ගැටුණු ළමුන්ගේ හා පාලනාතික්‍රාන්ත ළමුන්ගේ පුනරුත්ථාපනය සඳහා දෙපාර්තමේන්තු පාලනය යටතේ සහතික කළ පාසල් පවත්වාගෙන යාම.

(7) වෙනත් ඕනෑම නීතියක් මගින් පනවා ඇති නෛතික ප්‍රතිපාදනයන් ප්‍රකාරව නිතිය හා ගැටුණු ළමුන් හා වැඩිහිටි වරදකරුවන් සම්බන්ධයෙන් අධිකරණය වෙත අදාළ වාර්තා සපයමින් පරිවාස,පසුභාර, පරිලෝචන, විවිධ අධීක්ෂණ නියෝගයන්ට අදාළ අධීක්ෂණ කටයුතු පවත්වාගෙන යාම.

(8) වයඹ පළාත තුළ සිටින දිවා කාලයේ දී ස්වකීය දෙමාපිය භාරකරුවන්ට රැකවරණය සැළසිමට අපහසු වයස මාස 06 සිට අවුරුදු 05 දක්වා වූ ළමුන්ගේ කායික, මානසික සුරක්ෂිතභාවය සැලසෙන පරිදි පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම.

(9) මෙම ප්‍රඥප්තියේ 2 (5) උප වගන්තිය යටතේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන මගින් පවත්වා ගෙන යන දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ආයතනවල දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ දරුවන්ගේ උපරිම යහපත සඳහා අවශ්‍යතාවය පරිදි නඩත්තු ආධාර ලබා දීම, එවැනි ආයතනවලට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ලබාදීම සහ එවැනි ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම.

(10) නීතිය හා ගැටුණු ළමුන් තාවකාලිකව රඳවා ගැනීමට ආරක්ෂිත නිවාස පවත්වාගෙන යාම.

(11) අවු. 18 ට අඩු ගර්භනී ළමුන් හා අවු. 18 ට අඩු ළමා මව්වරුන් හා ඔවුන්ගේ ළමුනට රැකවරණය ලබා දෙන ළමා සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

(12) අනාථ, අත්හළ, අසරණ හෝ අපයෝජනයන්ට ලක්වීම හේතුවෙන් නිසි භාරය, රැකවරණය, පෝෂණය හා නඩත්තුව නොලැබෙන වෙනත් නීතියකින්, ප්‍රඥප්තියකින් හෝ ආවරණය නොවන ළමුන් සඳහා පෝෂණ හා අධ්‍යාපන ආධාර ලබාදීම.

(13) ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ළමා අපයෝජන අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම.

(14) ආරක්ෂිතව වාසය කිරීමට නිවසක් නොමැති වීම හේතුවෙන් ළමා නිවාස ගත ළමුන් නැවත පවුල තුළට යොමු කිරීම සඳහා හෝ අසරණ ළමුන් ළමා සංවර්ධන මධ්‍යස්ථාන ගත වීම වලක්වා ස්වකීය පවුල තුළම රඳවා ගැනීමේ අරමුණින් පිළිසරණිය ආධාර ලබා දීම.

(15) අසරණ ළමුන්, ළමා සංවර්ධන මධ්‍යස්ථාන ගත කිරීම වැළැක්වීම සඳහා ස්වයං රැකියා සඳහා පුහුණුව ලබා දීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

(16) 07 වන වගන්තිය යටතට ගැනෙන ආයතනයන්හි කාර්යය මණ්ඩලය හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම.

(17) වයඹ පළාත තුළ පිහිටි ළමුන් සඳහා වන සියලුම පෞද්ගලික අධ්‍යාපනික ආයතන, නේවාසිකාගාර, ළමුන්ට රැකවරණය ලබා දෙන ආගමික මධ්‍යස්ථාන හා ළමුන් සඳහා පිහිටුවා ඇති වෙනත් ආයතන, ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් පවත්වාගෙන යන බව තහවුරු කර ගැනීමට අදාළව ප්‍රමිති සකස් කිරීම හා නියාමනය කිරීම.

(18) අධිකරණය මගින් පුනරුත්ථාපනය සඳහා යොමු කළ ළමුන්ගේ, හෝ භාරය රැකවරණය නොමැති වීම හේතුවෙන් නීතිය හා ගැටුණු ළමුන්ගේ හෝ වැඩිහිටියන්ගේ සුභසාධන කටයුතු, නඩත්තු හා අධ්‍යාපනික කටයුතු සඳහා පහසුකම් සැලසීම.

(19) කුලවැද්දුම් නඩුකරවලදී නඩුවේ භාරකරු ලෙස කටයුතු කරමින් අධිකරණ වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ළමුන්ට අදාළ වෙනත් සිවිල් අධිකරණ ක්‍රියා මර්ගයන්හි දී අධිකරණය මගින් ඉල්ලා සිටින වාර්තා සැපයීම.

(20) වයඹ පළාත තුළ පිහිටි කිසියම් අධ්‍යාපන ආයතනයක ,ළමා අපයෝජනයක් හෝ අපචාර ක්‍රියාවක් හෝ ළමා හිමිකම් නිසි පරිදි ආරක්ෂා නොවන බව වාර්තා වූ විට ඒ පිළිබඳව පූර්ණ විමර්ශනයක් සිදු කර අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග සඳහා යොමු කිරීම.

06. (1) මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යන් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු හෝ වාර්තා පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් හෝ කොමසාරිස් විසින් බලය පවරනු ලබන වෙනත් නිලධරයෙකු විසින් යම් ආයතනයක කළමනාකාරීත්වය හෝ පුද්ගලයකු වෙතින් ඉල්ලා සිටියහොත් ආයතන කළමනාකාරීත්වය විසින් හෝ එම පුද්ගලයා විසින් කොමසාරිස් වෙත එම තොරතුරු ලබාදිය යුතු වන්නේ ය. දෙපාර්තමේන්තුවේ බලතල

(2) වයඹ පළාත තුළ පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා ළමුන් සඳහා අධ්‍යාපන, නේවාසික පහසුකම් හා විවිධ සේවා සපයන සියලුම ආයතන රජයේ හෝ පළාත් සභාවේ කුමන ආයතනයක් යටතේ ලියාපදිංචිය ලබාගෙන තිබුණ ද නොතිබුණ ද, එම සියලු ආයතනවලට පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් හෝ ඔහු හෝ ඇය විසින් බලය පවරනු ලබන යම් නිලධරයෙකුට කලින් දැනුම් දීමකින් තොරව අවශ්‍ය වූ විටෙක ඇතුල්වීමට හා මෙම ප්‍රඥප්තියේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා,

*(අ)* යම් පරීක්ෂා කිරීමක් සිදු කිරීමට,
*(ආ)* විභාග කිරීමක් කිරීමට,
*(ඇ)* විමර්ශනය කිරීමට,
*(ඈ)* සමීක්ෂණයක් පැවැත්වීමට,
*(ඉ)* එම කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ලේඛන පරීක්ෂා කිරීම, ලේඛනවල සත්‍ය පිටපත් ලබා ගැනීම හෝ තොරතුරු ලබාගැනීමට,
*(ඊ)* අවශ්‍ය ලිපිලේඛන ලබාගැනීම ඇතුළු යම් ක්‍රියාවක් කිරීමට බලය ඇත්තේ ය.

## II කොටස

### ළමුනට අදාළ සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම

ළමා සංවර්ධන මධ්‍යස්ථාන, ආයතන ලියාපදිංචි විය යුතු බව

07. (1) මෙම ප්‍රඥප්තියේ අංක 05 වගන්තිය යටතේ දැක්වෙන කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් වයඹ පළාත තුළ ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ඒ හා සමාන අරමුණකින් ළමුන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන හා සේවා සපයනු ලබන ආයතන සියල්ල වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු වන්නේය.

(2) විදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් හෝ තනි ශාඛාවක්, එවැනි සංවිධානයක මූල්‍ය සම්පාදනයෙන් පවත්වාගෙන යන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ ආයතනයක් නම්, ශ්‍රී ලංකා රජයේ සමාජ සේවා අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ මහ ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේද ලියාපදිංචි විය යුතු වන්නේය.

(3) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන විට වයඹ පළාත තුළ පවත්වාගෙන යනු ලැබූ ඉහත 7(1) සහ 7(2) වන වගන්තියේ සඳහන් ආකාරයේ සෑම නිවාසයක් හෝ ආයතනයන්ට මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය ලබා ගත යුතු වන්නේය.

තාවකාලික ලියාපදිංචිය ලබා ගැනීම

(4) මෙම ප්‍රඥප්තියේ අංක 05 වගන්තිය යටතේ දැක්වෙන කාර්යයන් හා කාර්ය භාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් වයඹ පළාත තුළ කුමන පදනමකින් හෝ අළුතින් ආරම්භ කෙරෙන ළමා සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා ළමයින් වෙනුවෙන් සේවා සපයනු ලබන ආයතන සියල්ල එසේ ආරම්භ කිරීමට පෙර වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ තාවකාලික ලියාපදිංචිය ලබාගත යුතු වන්නේය.

(5) එසේ ලියාපදිංචිය ලබා ගෙන ආරම්භ කරනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ළමයින් සඳහා සේවය සපයන වෙනත් ආයතන එසේ අරඹා වර්ෂයක කාලයක් තුළ හෝ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන වර්ෂයකට අඩු කාල සීමාවකදී ස්ථිර ලියාපදිංචිය ලබාගත යුතු වන්නේය. ස්ථිර ලියාපදිංචිය ලබා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් හා සම්පූර්ණ කළ යුතු අවම ප්‍රමිතීන් හා අවශ්‍යතා ඉහත 7(4) වන උපවගන්තිය යටතේ තාවකාලික ලියාපදිංචිය ලැබූ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක හෝ ළමුන් සඳහා සේවා සපයන වෙනත් ආයතනයක් ප්‍රඥප්තියේ 28 වගන්තිය යටතේ සඳහන් නියෝග මගින් නියම කරනු ලබන නියමිත ප්‍රමිතීන්ට අනුව කටයුතු කරන බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, ස්ථිර ලියාපදිංචිය ලබා දිය හැකිය .

08. මෙම ප්‍රඥප්තියේ 29 වගන්තිය යටතේ පනවා ලියාපදිංචිය සඳහා සුදුසුකම් ඇති නියෝග මගින් නියම කර ඇති අවම ප්‍රමිතීන්ට අනුව කටයුතු නොකරන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හෝ වෙනත් සේවා සපයන ආයතනයක් ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන්නේය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම

09. මෙම ප්‍රඥප්තියේ 8 වන වගන්තිය යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ යම් ආයතනයක් ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන අවස්ථාවක ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ බවට කොමසාරිස්වරයා විසින් අදාළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය හෝ ආයතනය වෙත ලිඛිතව දැනුම් දිය යුතු වන්නේය.

ලියාපදිංචිය අවලංගු කිරීම

10. (1) මෙම ප්‍රඥප්තියේ අරමුණුවලට පටහැනිව ක්‍රියාත්මක කරන බවට හෝ නියෝග මගින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකරන බවට හෝ කොමසාරිස්වරයා තීරණය කරනු ලබන අවස්ථාවක කොමසාරිස්වරයාට එවැනි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ ආයතනයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැක්කේය.

(2) ලියාපදිංචිය අවලංගු කළ බව එසේ කිරීමට හේතු වූ කරුණු සමග කොමසාරිස්වරයා විසින් අදාළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය හෝ ආයතනය වෙත ලිඛිතව දැනුම් දිය යුතු වන්නේය.

(3) මෙම ප්‍රඥප්තියේ 9 වන වගන්තියට අනුව හෝ 10 (1) උපවගන්තියට අනුව හෝ කොමසාරිස්වරයා

කටයුතු කරගෙන යන අතරතුර 28 වන වගන්තිය යටතේ පනවන ලද නියෝග මගින් නියම කරනු ලබන නියමිත ප්‍රමිතීන්ට අනුව කටයුතු නොකරන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන විට ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ ආයතනයේ සේවාව ලබන ළමුන් ඉවත් කළ හැකි වන්නේය.

11. මෙම ප්‍රඥප්තියේ 9 වන වගන්තිය යටතේ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ බවට හෝ 10 වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කළ බවට හෝ දැන්වීමක් ලැබී දින 30 ක් ඇතුළත කොමසාරිස්වරයාගේ තීරණය සම්බන්ධව අතෘප්තියට පත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ ආයතනයේ කළමනාකාරිත්වය විසින් ඊට එරෙහිව විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේය. ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් අභියාචනා බලතල

12. (1) මෙම ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ අභියාචනයක් ලද අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කොට තීරණයක් ලබා දීමට , අමාත්‍යවරයා විසින් ලේකම්වරයාට නියම කළ හැක්කේය.

(2) ලේකම්වරයා විසින් ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව, කොමසාරිස්වරයාගේ තීරණය තහවුරු කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ කටයුතු කළ හැකි වන්නේය.

(3) අභියාචනය ලැබී මාස 03 ක් ඇතුළත ලේකම්වරයාගේ තීරණය ලබා දිය යුතු අතර, එම තීරණය අවසානාත්මක වන්නේය.

13. (1) මෙම ප්‍රඥප්තියේ 9 වන අ වගන්තිය යටතේ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ හෝ 10 (1) වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන හෝ ආයතන එසේ ප්‍රතික්ෂේප කළ දින සිට හෝ අවලංගු කළ දින සිට දින 30 ක් ඇතුළත වසා දැමීමට කටයුතු කළ යුතුය. ළමා සංවර්ධන මධ්‍යස්ථාන හෝ ආයතන වසා දැමීම

(2) එසේ වුවද මෙම ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක අභියාචනා පරීක්ෂණයේ තීන්දුව ලැබෙන තෙක් වසාදැමීම ප්‍රමාද කළ හැකිය.

(3) මෙම ප්‍රඥප්තියේ 12(2) වන වගන්තිය යටතේ අභියාචනා පරීක්ෂණයෙන් කොමසාරිස්වරයාගේ තීරණය තහවුරු වූ අවස්ථාවක එම තීන්දුව ලබා දුන් දින සිට දින 30ක් ඇතුළත අදාළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය හෝ ආයතනය වසා දැමීමට කටයුතු කළ යුතුය.

14. (1) මෙම ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ ආයතනයක් පවත්වාගෙන යාම සඳහා කටයුතු කරන සෑම ස්වේච්ඡා සංවිධානයක් විසින්ම ස්වකීය ළමා සංවර්ධන මධ්‍යස්ථානය හෝ ආයතනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා සමග ගිවිසුමකට එළැඹිය යුතුය. ගිවිසුම්ගතවන කොන්දේසි නියෝග මගින් පැනවිය යුතුය. ආයතන නියාමනය

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කාලානුරූපව හෝ අවස්ථානුකූලව හෝ නියම කළ යුතු යැයි අමාත්‍යවරයා හෝ කොමසාරිස්වරයා හෝ අදහස් කරන උපදෙස් හෝ නියමයන් හෝ මාර්ගෝපදේශයන් චක්‍රලේඛ මගින් හෝ නියෝග මගින් හෝ නිකුත් කළ හැකිය.

(3) 14(2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන උපදෙස් හෝ නියමයන් හෝ මාර්ගෝපදේශයන් හෝ මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා ලියාපදිංචි වී ඇති සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ ආයතනයක් හෝ විසින් පිළිපදින බවට හෝ අනුගමනය කරන බවට එහි කළමනාකාරිත්වය වග බලා ගත යුතුය.

## III කොටස

### වයඹ පළාත් ළමාරක්ෂක සේවා අරමුදල

15. මෙහි මින්මතු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන "වයඹ පළාත් ළමාරක්ෂක සේවා අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කොට පවත්වාගෙන යා යුතු වන්නේය. වයඹ පළාත් ළමාරක්ෂක සේවා අරමුදලේ සංයුතිය

16. (1) මෙම අරමුදලේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

(අ) රජයේ මුදල් ආධාර වශයෙන් වරින්වර ප්‍රදානය කරනු ලබන මුදල්,
(ආ) වයඹ පළාත් සභාව විසින් මෙම අරමුදලේ කාර්යය සඳහා සම්මත කරනු ලබන මුදල්,
(ඇ) පළාත් සභා පනතේ 22 වගන්තිය යටතේ විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියලුම මුදල්,
(ඈ) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රම වලින් ලබාගන්නා සියලුම මුදල්,
(ඉ) යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් හෝ සංවිධානයක් මගින් කෙරෙන පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල් හා දේපළ,
(ඊ) අරමුදලේ මුදල් ආයෝජනයෙන් ලැබෙන පොළිය හෝ ලාභය හෝ ලැබෙන මුදල්,
(උ) අධිකරණවලින් ලැබෙන අරමුදල්.

(2) මෙම ප්‍රඥප්තියේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා දරනු ලබන වියදම් මෙම අරමුදලට වැය බරක් වන්නේ ය.

17. පහත සඳහන් කාර්යයන් සඳහා පමණක් අරමුදලේ මුදල් යෙදවිය හැකි වන්නේ ය.

අරමුදල් වියදම් කළ හැකි කාර්යයන්.

(අ) රජයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන හෝ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය,
(ආ) රජයේ හෝ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ළමුන්ට සේවා සපයන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙනත් ආයතනයන්හි කාර්ය මණ්ඩල සුභ සාධන සේවා වැඩිදියුණු කිරීම.
(ඇ) ළමුන් හා සම්බන්ධ අධ්‍යයන, පර්යේෂණ හා පුහුණු කටයුතු.
(ඈ) ළමා රැකවරණය සම්බන්ධව කටයුතු කරන කාර්ය මණ්ඩල පුහුණු කිරීම.
(ඉ) දෙපාර්තමේන්තු සේවාවන් ප්‍රජාව වෙත සමීප කිරීමට අදාළව ප්‍රචාරක යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.
(ඊ) ලියාපදිංචි දිවා සුරැකුම් මධ්‍යස්ථානවල දරුවන්ගේ ආරක්ෂාවට මුල් ළමාවිය සංවර්ධනයට හෝ අදාළ යටිතල පහසුකම් සංවර්ධනය.
(උ) ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ළමා අපයෝජනය අවම කිරීම හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට දරුවන් ඇතුළත් කිරීම අවම කිරීම පිළිබඳව හෝ දරුවන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කළයුතු ආකාරය පිළිබඳව හෝ මුද්‍රිත ප්‍රකාශන, පොත්පත්, සඟරා මුද්‍රණය හා වාර්තා චිත්‍රපට නිෂ්පාදනය.
(ඌ) ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට ළමුන් ඇතුළත් කිරීමට කෙරෙන ඉල්ලීම්වලට විකල්ප වැඩ සටහන්, ව්‍යාපෘති හා නැවත පවුල් තුළට අන්තර්ග්‍රහණය කිරීමට අදාළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
(එ) දරිද්‍රතාවය නිසා අධ්‍යාපනය අහිමි වන දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම.
(ඒ) ආයතනගත හෝ තම පෞද්ගලික නිවසේ ජීවත්වන ළමයෙකුට වුවද දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලින් ආවරණය කළ නොහැකි කාර්යයන්.

අරමුදලේ ගිණුම.

18. (1) මෙම අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය බැංකුවක අරමුදල නමින් ගිණුම් පවත්වාගෙන යා යුතුය. අරමුදල සඳහා ලැබෙන සියලුම මුදල් අරමුදලේ මෙම ගිණුමට බැර කළ යුතුය.

(2) අරමුදලින් වියදම් දැරීම සඳහා වහාම අවශ්‍ය නොවන්නාවූ මුදල් රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය මුල්‍ය ආයතනයක හෝ ආයෝජනය කළ හැකිය.

අරමුදලේ භාරකාරත්වය.

19. අරමුදලේ භාරකාරත්වය වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් දැරිය යුත්තේය.

20. අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු වන්නේය.

අරමුදල් ගිණුමේ මුදල වර්ෂය අරමුදල් ගිණුමේ මුදල විගණනය.

21. රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන හා වයඹ පළාත් සභාවේ මූල්‍ය රීති මෙම අරමුදල් ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු වන්නේය.

22. අමාත්‍යවරයා විසින් ලිත් වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත එකී ලිත් වර්ෂය සඳහා වූ අරමුදල් ගිණුමේ පරිපාලනය ගැන වූ වාර්තාවක් ද විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුමේ පිටපතක් ද එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ද සභාගත කළ යුතු වන්නේය.

අරමුදල් ගිණුම පිළිබඳ වාර්තාව.

23. (1) මෙම අරමුදලේ පරිපාලනය සඳහා කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවිය යුත්තේය.පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලය සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතු වන්නේය.

අරමුදලේ කළමනාකරණ මණ්ඩලය.

*(අ)* විෂය භාර අමාත්‍යාංශ ලේකම්,
*(ආ)* පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස්,
*(ඇ)* විෂයය අයත් අමාත්‍යාංශයේ ගණකාධිකාරී,
*(ඈ)* දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් හෝ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරියෙකු
*(ඉ)* විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන වයඹ පළාතේ ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයන් පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන හෝ ආයතන වල කළමනාකාරීත්වයේ නියෝජිතයන් දෙදෙනෙකු.

(2) අමාත්‍යාංශ ලේකම්වරයා කළමනාකරණ මණ්ඩලයේ සභාපති විය යුතු අතර, පළාත් කොමසාරිස්වරයා කළමනාකරණ මණ්ඩලයේ ලේකම් විය යුතු යුතුය.

(3) කළමනාකරණ මණ්ඩලය සඳහා මෙම ප්‍රඥප්තියේ 23 (1) (ඉ) වගන්තිය යටතේ පත් කළ සාමාජිකයෙකුගේ ධුර කාලය, පත් කළ දින සිට වසර 3 ක කාලයකට සීමා වන්නේය.

(4) නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකුගේ සාමාජිකත්වය එම නිලය දැරීම අවසන් වනවාත් සමගම අහෝසි වන අතර, අනුප්‍රාප්තික තැනැත්තා පුරප්පාඩු වූ ධුරය සඳහා පත් කළ යුත්තේය.

(5) ඉල්ලා අස්වූ හෝ ඉවත් කළ සාමාජිකයෙකුගේ ධුර කාලයේ ඉතිරි කාල සීමාව සඳහා අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ 23(1) (ඉ) උප වගන්තියේ සඳහන් අයෙකු පත් කළ හැකිය.

(6) ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ඇතිවන පුරප්පාඩුවක් සඳහා නැවත පත් කරන සාමාජිකයෙකුගේ ධුර කාලය පූර්වගාමියාගේ ධුර කාලයේ ඉතිරි කොටසට සීමා විය යුතුය.

(7) අමාත්‍යවරයා විසින් අරමුදලේ කළමනාකරණ මණ්ඩලය සඳහා එක් වරක් පත් කළ අයෙකු නැවත පත් කිරීමට බාධාවක් නොමැත.

කළමනාකරණ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම.

24. කළමනාකරණ මණ්ඩලය සඳහා මෙම ප්‍රඥප්තියේ 23(1)(ඉ) වගන්තිය යටතේ පත් කරන ලද ඃ

(1) සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලිඛිත ඉල්ලීමක් මගින් සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට අවකාශ ඇත.
(2) සාමාජිකයෙකු යම් අධිකරණයකදී සාපරාධී වරදකට වැරදිකරු වූ බවට හෙළිදරව් වුවහොත් හෝ යම් විෂමාචාර ක්‍රියාවක් හේතුවෙන් වැරදිකරුවෙකු වූ බවට හෙළිදරව් වුවහොත් හෝ විෂයභාර අමාත්‍යවරයා විසින් එම තැනැත්තා සාමාජිකත්වයෙන් ඉවත් කළ යුතුය.
(3) සාමාජිකයෙකුගේ සේවය පිළිබඳව අමාත්‍යවරයා සෑහීමට පත් නොවන අවස්ථාවකදී, අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සාමාජිකත්වයෙන් ඉවත් කළ හැකිය.

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා නුසුදුසුකම්.

25. (1) තත්කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකයෙකු හෝ වශයෙන් ධුර දරන තැනැත්තෙකු,

(2) සිහිවිකල් තැනැත්තෙකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු හෝ සාපරාධී වරදකට වරදකරුවෙකු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබූ තැනැත්තෙකු, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා පත් කිරීමට නුසුදුසු වන්නේය.

කළමනාකරණ මණ්ඩලයේ බලතල හා කාර්යයන්.

26. කළමනාකරණ මණ්ඩලයේ බලතල හා කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(1) අරමුදලේ පරිපාලනය සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

(2) අරමුදලේ කටයුතු කළමනාකරණය, මෙහෙයවීම හා ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳ උපදෙස් ලබා දීම.

(3) මෙම ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුකාරවරයා විසින් නියම කරන සීමාවන්ට යටත්ව අරමුදලෙන් වියදම් දැරීම සඳහා අනුමැතිය ලබාදීම.

(4) අරමුදල් ගිණුමේ කළමනාකරණය පිළිබඳ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් හා ගණපූරණය.

27. (1) අරමුදලේ කළමනාකරණ මණ්ඩලය අවම වශයෙන් මාස 03 කට වරක් රැස්විය යුතු වන්නේය.

(2) රැස්වීමේ ගණපූරණය තිදෙනෙකි.

(3) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීම කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සඳහා බාධාවක් නොවිය යුතුය.

(4) රැස්වීම් සඳහා සහභාගිවන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සඳහා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දීමනාවක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ගෙවනු ලැබිය හැකිය.

## IV කොටස

### පොදු විධිවිධාන

නඩු පැවරීමේ බලය.

28. මෙම ප්‍රඥප්තියේ 30 වන වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලැබූ විට නඩු පැවරීමේ බලය අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධරයෙකු හෝ සතු වන්නේය.

නියෝග පැනවීම.

29. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග පනවනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකොට දින 30 ක කාලයක් ඉකුත් වූ වහාම පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

(3) පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී නියෝගය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

## V කොටස

### වැරදි හා දණ්ඩන

වැරදි.

30. (1) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් යටතේ හෝ සාදන ලද හෝ සපයනු ලබන හෝ යම් වාර්තාවක හෝ වෙනත් ලේඛනයක් මත දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන්නාවූද;

(2) මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූද,

(3) පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ නියමයන් හෝ මාර්ගෝපදේශයන් හෝ නියෝග, සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින්නාවූද;

(4) මෙම ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ නැතහොත් ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තෙකු වෙත පැවරී ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලතල, කර්තව්‍යයන් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නාවූ,

(5) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ විධිවිධානයක් හෝ කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම උවමනාවෙන්ම පැහැර හරින සහ/හෝ උවමනාවෙන් අවහිර කරන්නාවූ ද, යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

31. මෙම ප්‍රඥප්තිය යටතේ වරද සිදුකරනු ලැබූ විට නඩු පැවරීමේ බලය පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා වෙත හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු සතු වන්නේය. නඩු පැවරීමේ බලය.

32. මෙම ප්‍රඥප්තියේ 30 වැනි වගන්තිය යටතේ ගැනෙන වරදක් සිදුකරනු ලබන සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකට වරදකරු වූ කල්හී, රුපියල් දසදහසක (රුපියල් 10,000/-) අවමයකට හා රුපියල් ලක්ෂය (රුපියල් 100,000/-) නොඉක්මවන උපරිමයකට යටත් දඩයකට හෝ මාස හයක් (6) නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ යුතු වන්නේය. දඬුවම්.

33. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතනවල නඩත්තු කටයුතු උදෙසා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ සඳහන් විධිවිධාන අදාළ වන්නේය.

## VI කොටස

### අර්ථ නිරූපණ

34. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ අර්ථ නිරූපන.

(1) "ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාද,

(2) "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යවරයා ද ,

(3) "ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

(4) "කොමසාරිස්" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 4 (1) වගන්තිය යටතේ වයඹ පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා පත්කරනු ලැබ ඇති පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාද,

(5) "අරමුදල" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 15 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදල,

(6) "ස්වේච්ඡා සංවිධාන" යන්නෙන් 1980 අංක 31 දරන ස්වේච්ඡා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථයම ද;

(7) "අනාථ" යන්නෙන් නිත්‍යානුකුලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් දෙමාපියන් දෙදෙනා මිය ගිය එක් අයකු මියගොස් අනෙක් තැනැත්තාට දෙමාපියෙකු ලෙස කටයුතු කල නොහැකි, හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ මවකට උපන් ළමයෙක් නම් මව මියගිය හෝ මව වශයෙන් කටයුතු කල නොහැකි තැනැත්තියකගේ ළමයෙකුද ,

(8) "අත්හළ" යන්නෙන් නීත්‍යානුකූල විවාහ වූ දෙමාපියන්ට උපන් දරුවෙකු වන විට දෙමාපියන් දෙදෙනාම විසින් අත්හැර දමා තිබීම, එක් අයෙකු විසින් අත්හැර අනෙක් තැනැත්තා මිය ගොස් තිබීම හෝ දෙමාපියකු වශයෙන් ක්‍රියා කිරීමට නොහැකි විම, දෙමාපියන් දෙදෙනාටම දෙමාපියන් ලෙස ක්‍රියා කිරීමට නොහැකි වීමක දී සහ නීත්‍යානුකූල විවාහයක් නොමැති විටකදී මව විසින් දරුවා අතහැර දමා තිබීම හෝ මවට දෙමාපියෙකු වශයෙන් ක්‍රියා කිරීමට නොහැකි විටක දී හෝ අධිකරණ නියෝගයක් මත භාරකාරත්වය පැවරී ඇති අවස්ථාවක අදාළ නෛතික භාරකරු විසින් අත්හැර දමන ලද එවැනි අවස්ථාවකට පත් වූ ළමයෙකු ද,

(9) "අසරණ" යන්නෙන් භාරය හා ආරක්ෂාව අවශ්‍ය,රජයේ දෙපාර්තමේන්තු මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලබන මහජන සහනාධාර ලබන දෙමාපියන්,දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් අනුව රැකියාවක් කිරීමට නොහැකි තත්වයට පත්වූ රෝගී තත්වයක සිටින හා අනෙක් තැනැත්තා/තැනැත්ති (මව හෝ පියා හෝ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති හෝ දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් මත මානසික රෝගියෙකු යැයි නිශ්චය කර ඇති සහ අනෙක් තැනැත්තාට/තැනැත්තියට (මව හෝ පියා හෝ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති හෝ උසාවි නියෝගයක් මත හෝ වෙනත් ආකාරයකින් දෙමාපියන් වෙන් වූ පවුලක ළමුන්ගේ භාරකාරත්වය දරන මවට හෝ පියාට හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නැති හෝ වෙනත් ආධාරයක් නොලැබුවද ආධාරයක් ලැබීම අවශ්‍ය බැව් ග්‍රාම නිලධාරි හෝ පරිවාස නිලධාරි විසින් තහවුරු කරනු ලබන දෙමාපියකුගේ ළමයෙකු ද,

(10) "අපයෝජනය" යන්නෙන්,

*(අ)* 1995 අංක 22 දණ්ඩ නීති සංග්‍රහය යටතේ දක්වා ඇති අර්ථයම ද,

*(ආ)* 1956 අංක 47 දරන පනතට අනුව ස්ත්‍රී, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනතේ ළමුන් සේවයේ යෙදවීමට අදාළ විධිවිධානයන් ද ,

*(ඇ)* ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ කවර හෝ විධිවිධානයක් ද,

*(ඈ)* 1997 අංක 01 දරන අනිවාර්යය අධ්‍යාපන නියෝග වල කවර හෝ විධිවිධානයක් ද,

(11) "අපහරණය" යන්නෙන් (15 වන අධිකාරිය) දණ්ඩ නීති සංග්‍රහයේ දැක්වෙන අර්ථයම ද,

(12) "පරිවාස නිලධාරියා" යන්නෙන් 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස භාරයට ගැනීමේ ආඥා පනතේ 17 වන වගන්තිය අනුව පත් කරන ලද නිලධාරියකු ද, 17 (2) යටතේ පත්කරන ලද ස්වේච්ඡා පරිවාස නිලධාරියෙකු ද ?

(13) "පළාත් භාර ගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය යන්නෙන්" අවු 05 ට අඩු අනාථ,අත්හල,අසරණ හා අපයෝජනයට ලක් වූ ළමුන් නේවාසිකව රැකබලා ගැනීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන ආයතනයක් ද,

(14) "ළමා සංවර්ධන මධ්‍යස්ථාන" යන්නෙන් අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමුන් භාර ගැනීම, ඔවුන් නේවාසිකව තබා ගැනීම ඔවුන්ට භාරය හා ආරක්ෂාව සැපයීම සඳහා ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන මගින් පවත්වාගෙන යනු ලබන සියළු ආකාරයේ ආයතන, ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා අධිකරණ මගින් යොමු කරනු ලබන්නා වූ අනාථ, අත්හල,අසරණ හා අපයෝජනයට ලක් වූ ළමුන්, ගර්භනී ගැහැණු ළමයින් හා ළමා මව්වරුන් භාරගැනීම ඔවුන් නේවාසිකව තබා ගැනීම ඔවුන්ට භාරය හා ආරක්ෂාව සැපයීම සඳහා ස්වෙච්ඡා සංවිධාන මගින් පවත්වා ගෙන යනු ලබන සියළු ආකාරයේ ආයතන හා සංවර්ධන මධ්‍යස්ථානයක් ද,

(15) "දිවා සුරැකුම් මධ්‍යස්ථානය" යන්නෙන් දෙමාපියන්ට/භාරකරුවන්ට දිවා කාලයේදී රැකවරණය ලබා දීමට අපහසු වූ වයස මාස 06 ත් අවුː 05 ත් අතර ළමුන්ට රැකවරණය ලබාදීමේ පහසුකම් සහිත ආයතනයක් ද,

(16) "ආරක්ෂිත නිවාස" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 4 (10) උප වගන්තිය යටතේ පිහිටුවනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ද,

(17) "සහතික පාසලක්" යන්නෙන් ප්‍රඥප්තියේ 4 (6) උපවගන්තිය යටතේ ස්ථාපනය කළ මධ්‍යස්ථානයක් ද ,

(18) "වයස අවුː 18 ට අඩු ළමා මව්වරුන් හා ළමා ගැබිණියන් සඳහා වන මධ්‍යස්ථානයක්" යන්නෙන් ප්‍රඥප්තියේ 4 (11) උප වගන්තිය යටතේ ස්ථාපිත රැකවරණ මධ්‍යස්ථානයක් ද,
"ළමයා" යන්නෙන් වයස අවු. 18 ට නොවැඩි ස්ත්‍රී, පුරුෂ ඕනෑම පාර්ශවයක අයෙකු ද, අදහස් වේ.

(19) "මූල්‍ය ආයතනය" යන්නෙන් 100% රජයේ කොටස් සහිත මුදල් තැන්පතු බාරගැනීම සඳහා බලපත්‍ර ලබා ඇති ආයතන ද;

(20) "රාජ්‍ය බැංකුව" යන්නෙන් මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ද; අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවූවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

02-610